// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1799/8 — 2013 පෙබරවාරි මස 27 වැනි බදාදා - 2013.02.27

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය වර්ණකුලසූරිය ඇන්ටනී නිමල් ලාන්සා වන මවිසින් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1614/28 දරන 2009.08.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (ඉ) උපලේඛනයේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව විධායක ඉංජිනේරු කොට්ඨාසයට අදාළව අනු අංක 47 යටතේ දක්වා ඇති මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොච්චිකඩේ - වැලිහේන - දලුපොත මාර්ගය 2013.02.18 දින සිට ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මාවත යනුවෙන් හැඳින්විය යුතු බව ප්‍රකාශ කර සිටිමි. එම මාර්ගයට සම්බන්ධ විස්තර 2013.02.18 දින සිට පහත පරිදි සංශෝධනය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

| | | | *මාර්ග කොටස* | | | |
|---|---|---|---|---|---|---|
| *අනු අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *මාර්ගයේ නම* | *සිට කි.මී.* | *දක්වා කි.මී.* | *මුලු දිග කි.මී.* | *පළල මීටර්* |
| 47 | මීගමුව | ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මාවත | 0.00 | 5.11 | 5.11 | 10.00 |

වර්ණකුලසූරිය ඇන්ටනී නිමල් ලාන්සා,
මාර්ග සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන,
නිවාස හා ඉදිකිරීම්, ධීවර සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
මාර්ග සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන,
නිවාස හා ඉදිකිරීම්, ධීවර සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ (බ.ප.) දී ය.

03 - 631

1A - PG 001570 — 340 (2013/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*